www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# පළමුවාර අවසාන ඇගයීම - 2018
# First term End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ....................................................................................... විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

❖ අංක 01 සිට 20 දක්වා සියලු ම ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපයෝගී වන සැම දෙයක් ම හඳුන්වන පොදු නම කුමක් ද?
(1) පුරාවස්තු ය. (2) මූලාශ්‍රය ය. (3) ජනකථා ය. (4) බණපොත් ය.

(02) දික්සද පිරිවෙන් වාසී මහානාම හිමි රචනා කරන ලද සාහිත්‍යය මූලාශ්‍රය කුමක් ද?
(1) දීපවංසය (2) ථූපවංසය (3) මහාවංසය (4) චූලවංසය

(03) පොළොන්නරුවේ ගල් විහාරය කරවන ලද්දේ,
(1) දේවානම්පියතිස්ස රජු ය. (2) මහා පරාක්‍රමබාහු රජු ය.
(3) නිශ්ශංකමල්ල රජු ය. (4) දුටුගැමුණු රජු ය.

(04) ඉතිහාසය ඉගෙන ගැනීමට ප්‍රයෝජනවත් වන පැරණි පොත් පත් ජනකථා හා ලියන ලද දේ හැඳින්වෙන්නේ,
(1) සාහිත්‍යමය මූලාශ්‍රය ලෙස ය. (2) පුරා විද්‍යාත්මක මූලාශ්‍රය ලෙස ය.
(3) ඓතිහාසික කථා ලෙස ය. (4) බණ කථා ලෙස ය.

(05) ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තියෙන් පසු කාලය හැඳින්වෙන්නේ,
(1) ක්‍රිස්තු වර්ෂ නමින් ය. (2) ක්‍රිස්තු පූර්ව නමින් ය.
(3) ශක වර්ෂ නමින් ය. (4) බුද්ධ වර්ෂ නමින් ය.

(06) මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩම කරවන ලද්දේ කිතු උපතින් අවුරුදු කීයකට පෙර ද?
(1) අවුරුදු 200කට පෙර ය. (2) අවුරුදු 250කට පෙර ය.
(3) අවුරුදු 250කට පසු ය. (4) අවුරුදු 270කට පෙර ය.

(07) බුද්ධ වර්ෂ 1 දී සිදුවූ වැදගත් ම සිදුවීම පහත පිළිතුරු අතරින් තෝරන්න.
(1) බුදුන් වහන්සේගේ පරිනිර්වාණය (2) ක්‍රිස්තුස් වහන්සේගේ උප්පත්ති ය.
(3) වසභ රජුගේ කාලය ආරම්භවීම (4) මහසෙන් රාජ්‍යය සමය ඇරඹීම



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

(08) පළමුව ගොඩබිම මත පහළ වූයේ ශාක වර්ගයි. දෙවනුව ඇතිවූයේ,
(1) සත්ත්ව වර්ගයි. (2) බැක්ටීරියානුවන් ය.
(3) හැකැරැල්ලන් ය. (4) ඔපබීනියාවන් ය.

(09) A. සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස සෑදීම
B. එළවළු වර්ග පිස ආහාරයට ගැනීම
ඉහත A හා B සිදුවීම් හා සම්බන්ධ මානව වර්ගය වන්නේ,
(1) හෝමෝ ඉරෙක්ටස් ය. (2) හෝමෝ නියැන්ඩතාලෙන්සිස් ය.
(3) හෝමෝ හැබිලස් ය. (4) ඔස්ට්‍රලෝපිතිකස් ය.

(10) මහා හිම යුගයේ දී පොළොව මත ජීවත් වූ සත්ත්ව වර්ගයකි.
(1) චිම්පන්සීන් (2) වානරයින් (3) මැමත්අලි (4) ඩයිනෝසරයන්

(11) ආදී මානවයා සොයා ගත් දේ අදටත් අපට ඉතා ප්‍රයෝජනවත් වෙයි. එවැනි දෙයකට උදාහරණයකි.
(1) ජලය (2) ගින්දර (3) ගල් මෙවලම් (4) භාෂාව

(12) පැරන්නන් ඇටසැකිළි මත වර්ණාලේප කිරීම සඳහා භාවිතා කරන ලද ගල් විශේෂය වන්නේ,
(1) හිරිගල් ය. (2) හුණුගල් ය. (3) ගුරුගල් ය. (4) මැටිගල් ය.

(13) - එක් තැනක දිගු කාලයක් ජීවත්වීම
- දැව දඬු කොළ අතු භාවිතාකර නිවාස සෑදීම
ඉහත සිදුවීම හා සම්බන්ධ යුගය හඳුන්වන්නේ,
(1) නව ශිලා යුගය යි. (2) මධ්‍ය ශිලා යුගය යි.
(3) පූර්ව ශිලා යුගය යි. (4) පේලියෝ සොයික යුගය යි.

(14) මිනිසුන් ආගමික කටයුතුවලට නැඹුරුවීම පළමුවරට පිළිබිඹුවන්නේ,
(1) මධ්‍ය ශිලා යුගයේදී ය. (2) නව ශිලා යුගයේදී ය.
(3) පුරා ශිලා යුගයේදී ය. (4) ඓතිහාසික යුගයේදී ය.

(15) නව ශිලා යුගයේ සිදුවූ වැදගත් සිදුවීමකි.
(1) ගස්වල ගෙඩි වර්ග ආහාරයට ගැනීම.
(2) වර්ණ යොදා ගල් පර්වත මත චිත්‍ර ඇඳීම.
(3) දුනු - ඊතළ භාවිතය
(4) වත් පොහොසත්කම් මත දුප්පත් - පොහොසත් සේ මිනිසුන් බෙදීම

(16) මිනිසුන් එක් තැනක ජීවත්වීමේ පුරුද්ද වැඩි දියුණු වීම නිසා සිදුවූ වැදගත් සිදුවීම තෝරන්න.
(1) ගොවිතැන් සරුවීම (2) ගම්මාන බිහිවීම
(3) ගල් මෙවලම් නිපදවීම (4) දෙවියන් ඇදහීම



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

(17) බොහෝ සාරවත් දේ නිපදවූ මානවයා හැඳින්වෙන්නේ,
(1) ඔස්ට්‍රලෝ පිතිකස් (2) හෝමෝ ඉරෙක්ටස්
(3) හෝමෝ සාපියන් (4) හෝමෝ හැබිලස් නමිනි.

(18) මිනිසා විසින් පළමුවරට ගින්දර භාවිත කළ බවට සාක්ෂි හමුවී ඇති රට තෝරන්න.
(1) ඉරාකය (2) ඊශ්‍රායලය (3) චීනය (4) අරාබිය

(19) ගොවි යුගයේ දී ගොවිතැන් කටයුතු හා සතුන්ගේ ආරක්ෂාව පතා පැරණි මිනිසුන් අනුගමනය කළ දෙයකි.
(1) දෙවියන් ඇදහීම (2) ගල් මෙවලම් භාවිතය
(3) දුනු - ඊතළ භාවිතය (4) මලවුන් ඇදහීම

(20) පුරා විද්‍යාඥයින් විසින් පුරාණ කාලයට අයත් මැටියෙන් තනන ලද දෑ කැත්තක් සොයා ගනු ලැබුවේ,
(1) අප්‍රිකාවේ ගල් ගුහාවකින් ය. (2) චීනයෙනි.
(3) මෙක්සිකෝවෙනි. (4) ඊශ්‍රායලයේ ගල් ගුහාවකිනි.

(ලකුණු 2 x 20 = 40

## II කොටස

* පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
* අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (i) අපේ රටේ ඉතිහාසය ගැන තොරතුරු දැකගත හැකි පැරණි සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ක්‍රි. ව. 2018 බුද්ධ වර්ෂවලින් ලියන්න. (ලකුණු 02)
(iii) දීපවංසය රචනා වූ සියවස කුමක් ද? (ලකුණු 02)
(iv) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද? (ලකුණු 02)
(v) මෙය සාදා ඇත්තේ කෙසේ ද? (ලකුණු 02)
(vi) මෙම නිර්මාණය කළ මානව වර්ගයා නම් කරන්න. (ලකුණු 02)



(02) (i) ඉතිහාසය යන්නට සරල නිර්වචනයක් ලියන්න. (ලකුණු 03)
(ii) ඔබට ඔබේ රටේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දැන ගත හැකි ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 04)
(iii) ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(03) (i) ඉතිහාසයට අයත් කාල මැනීමට සුලභව භාවිතවන ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) පහත A හා B සිදුවීම හා සම්බන්ධ වර්ෂයන් ඉදිරියෙන් ලියන්න.

A. මහම්මත්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණි වර්ෂය .................

B. හින්දු දින දර්ශනයට අනුව ශක වර්ෂවල ආරම්භය ................. (ලකුණු 04)

(iii) පුරා විද්‍යාත්මක කැනීමක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) අප ආහාරයට ගන්නා පහත සඳහන් ආහාර වර්ග මුල් වරට වගා කළ රටවල් ඉදිරියෙන් ලියන්න.

- වී වගාව
- බඩඉරිඟු වගාව
- තිරිඟු වගාව (ලකුණු 03)

(ii) මිනිසා ජීවත් වූ ප්‍රදේශය හා මුහුණේ හැඩය අනුව කොටස් හතරකට බෙදේ. එම වර්ග හතර නම් කරන්න. (ලකුණු 04)

(iii) පුරා ශිලා යුගයේ මිනිසා අවමංගල්‍ය චාරිත්‍ර ඉටු කළ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාසවල මිනිසුන් ආහාරයට ගෙනඇති දේවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) හෙලොසීන යුගයේ දී සිදුවූ අළුත් දේශගුණික තත්ත්ව පිළිබඳ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) මුල් කාලයේ ඉදිකරන ලද නිවාසවල ස්වභාවය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 05)

(06) (i) මිනිසාගේ සංස්කෘතික දියුණුව සිදුවූ ප්‍රධාන අවධි තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පුරා ශිලා යුගයේ දී මිනිසුන් ජීවත් වූයේ කෙසේදැයි වැකි දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) සංස්කෘතික වෙනස්වීම් යනු කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) හෝමෝ සාපියන් මානවයා සතු දක්ෂතා තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) නව ශිලා යුගයේ මිනිසුන් වගා කළ ධාන්‍ය වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) මිනිසා ගොවිතැනට හුරු වීම නිසා ඇති වූ සුවිශේෂී වෙනස්කම් පිළිබඳව කෙටියෙන් ලියන්න. (ලකුණු 05)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk